එලෙසම ප්‍රතික්ෂේප කළ යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

අල්ලාහ්ට අලංකාරවත් නාමයන් තිබේ. ඔබලා ඔහුගෙන් එමගින්ම ප්‍රාර්ථනා කරන්න. ඔහුගේ නාමයන් වැරදි සහගතව පරිහරණය කරන්නන් (ප්‍රතික්ෂේප කොට) අත් හරින්න. ඔවුන්ගේ ක්‍රියාවන් සඳහා ඔවුන්ට (සුදුසු) කුලිය ලැබෙනු ඇත. *(අල්කුර්ආන්-7:180)*

ඔබලා (ඔහුව) අල්ලාහ් යනුවෙන් හෝ අර්රහ්මාන් යනුවෙන් හෝ (කැඳවා) ප්‍රාර්ථනා කරන්න. ඔබලා කිසියම් නාමයෙන් හෝ ඔහුව (කැඳවා) ප්‍රාර්ථනා කළේද, ඔහුට (විවිධ) අලංකාරමත් නාමයන් තිබෙන්නේය. *(අල්කුර්ආන්-18:110)*

මෙසේම අල්ලාහ්ගේ දූතවරයාවූ නබිනායක මුහම්මදු (සල්) තුමාගේ වදන්වලද සාදකයන් තිබේය. එතුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ පවසන්නේය.

අල්ලාහ් පුද්ගලයන් දෙන්නෙකු කෙරෙහි සිනහවන්නේය. ඔවුන්ගෙන් කෙනෙකු අනෙකා ඝාතනය කළාය. ඔවුන් දෙදෙනාම සුවර්ගයෙහි සිටිති. *(බුහාරි හා මුස්ලිම ග්‍රන්ථ ඇසුරෙනි)*

අපායට අදාල සුදුස්සන් එහි පිවිසෙමින් සිටිති. එවිට අපාය 'තවත් සිටින්නෙහිද ? තවත් සිටින්නෙහිද ?' යනුවෙන් අසමින් සිටී. අවසානයේදී දෙවියා තම කකුල (වෙනත් වාර්තාවෙහි තම පාදය) එහි තබයි. එවිට එහි සමහරුන් සමහරුන් සමග එකතුවී තදබදයෙන් සිටිති. එවිට අපාය 'ප්‍රමාණවත්වේ, ප්‍රමාණවත්වේ' යනුවෙන් පවසයි. *(බුහාරි හා මුස්ලිම ග්‍රන්ථ ඇසුරෙනි)*

සමහරයන් පාපයන් ලෙස පවතී. (එසේම, අන් අයගේ අඩුපාඩු ගැන) සමීක්ෂණය නොකරන්න' යනුවෙන් පවසන්නේය. *(අල්කුර්ආන්-49-12)*

15-ඔහුව රැවටීම, ඔහුට ද්‍රෝහිකම් කිරීම හා ඔහුව අසත්‍ය කිරීම තහනම්ය. මන්දයත්, අල්ලාහ් 'කවරෙකු විශ්වාසනීය පිරිමින් හා විශ්වාසනීය ස්ත්‍රීන් හට ඔවුන් නොකළ කාර්යයක් කෙරෙහි නින්දා කරන්නේද, ඔවුහු නිසැකයෙන්ම, දොස් පද හා ප්‍රසිද්ධ පාපයන් උසුලාගෙන සිටින්නෝය' *(අල්කුර්ආන්-33-58)* යනුවෙන් පවසන්නේය.

එසේම නබිනායක තුමා 'කවරෙකු කෙරෙහි ගුණාංග සතරක් පවතින්නේද, ඔහු පැහැදිලි කුහකයාය. කවරෙකු මත එයින් එක් ගුණාංගයක් තිබී, ඔහු එයින් ඉවත්වන තෙක් ඔහු කුහකකමෙහි එකී ගුණාංගයෙහිම සිටී. ඒවා, ඔහු විශ්වාස කළානම් ද්‍රෝහිකම් කරයි. ඔහු යමක් ප්‍රකාශ කළානම් අසත්‍යයම ප්‍රකාශ කරයි. ඔහු ගිවිසුමක් කළානම් එය බිඳ දමයි. ඔහු තර්ක කළානම් පාපයෙහි පිවිසේ' යනුවෙන් පැවසූ බව අබ්දුල්ලාහ් බින් අම්ර් (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

16-ඔහු හා සමග යහපත් සාර ධර්මයෙන් හැසිරීම. එනම්, ඔහුට උපකාර කිරීම ඔහුට හිරිහැර නොකිරීම, මුහුණේ ප්‍රබෝධයෙන් ඔහුව මුණ ගැසීම, ඔහු කරන උපකාරයන් පිළිගැනීම, ඔහුගෙන් සිදුවන වැරදීන් කෙරෙහි සමාව දීම හා ඔහුට කළ නොහැකි කාර්ය නොපැවරීම යනාදි ගුණධර්මයෙන් ඔහු හා සමග හැසිරිය යුතුයි. මන්දයත්, නබිනායක තුමා 'ඔබ කුමන ස්ථානයක සිටියද, අල්ලාහ් කෙරෙහි බියබැතිසිතින්

සිටින්න. අකුසලක් සිදුවූ විගස කුසලක් ඉටු කරන්න. එය (කුසල) අකුසල විනාශ කර දමයි. ඔබ මිනිසුන් අතරෙහි සාරධර්මයෙන් හැසිරෙන්න' යනුවෙන් පැවසූ බව අබූදර් (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි හා හාකිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

17–ඔහු තමාට වඩා වැඩිහිටියෙකුනම් ඔහුට ගරු කළ යුතුයි. ඔහු තමාට වඩා බාලයෙකුනම් ඔහුට ආදරය කළ යුතුයි. මන්ද, නබිනායක තුමා 'අප වැඩිහිටියන් ගරු නොකරන්නාද, අප බාලයන්ට ආදරය නොකරන්නාද අපේ අය නොවන්නාය' යනුවෙන් ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. *(අබූදාවූද් හා තිර්මිදි ග්‍රන්ථ ඇසුරෙනි)*

# කාෆිර්වරුන් කෙරෙහි සාරධර්ම

ඉස්ලාම් හැර අන් සියළු ආගම් අසත්‍ය බවද, ඒවා අනුගමනය කරන්නන් කාෆිර් හෙවත් ප්‍රතික්ෂේප කරන්නන් ලෙසද, ඉස්ලාම් ධර්මය පමණක් හෙතම සත්‍ය ආගම බවද, එය පිළිගෙන අනුගමනය කරන්නන් පමණක් විශ්වාසනීය මුස්ලිම්වරුවන් බවද මුස්ලිම්වරයා විශ්වාස කළ යුතුයි. මක්නිසාදයත්, අල්ලාහ් 'සැබැවින්ම, අල්ලාහ් වෙත පිළිගත් ආගමනම්, හෙතම එය ඉස්ලාමය වේ' *(අල්කුර්ආන්–3:19)* යනුවෙන්ද, 'ඉස්ලාමය හැර අන් කිසියම් ආගමක් කවරෙකු හෝ ප්‍රිය කරන්නේද, (එය) කිසිවිටක ඔහුගෙන් පිළිගනු නොලැබේ. (මෙවන්) අය පරලෝ දිනයේ අලාභකරුවන් අතරෙහි සිටිති *(අල්කුර්ආන්–3:85)* යනුවෙන්ද පවසන්නේය.

5-තිබෙන ආහාරය ගැන තෘප්තිවිය යුතු අතර ඒ ගැන විවේචනය නොකළ යුතුයි. කැමැති වුවද අනුභව කළ හැක. අකැමැති වුවද අනුභව නොකර සිටිය හැක. මක්නිසාදයත්, 'නබිනායක තුමා කිසියම් ආහාරයක් හෝ විවේචන නොකරන්නේය. කැමැති වුවද අනුභව කරන්නේය. අකැමැති වුවද (අනුභව නොකර) වැළකී සිටින්නේය' යනුවෙන් අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

6-අමුත්තා හෝ බිරිඳ හෝ දරුවා හෝ මෙහෙකරුවා හෝ සමග එක්ව ආහාර අනුභව කළ යුතුයි. මන්දයත්, නබිතුමාගේ ශ්‍රාවකරුවන් පිරිසක් එතුමාගෙන් 'අල්ලාහ්ගේ දූතයානෙනි, අපි ආහාර අනුභව කරන්නෙමු. එනමුත්, කුස පිරන්නේ නැතැ ? යනුවෙන් විමසුම් කළ විට එතුමා 'ඔබලා තනිතනිවද අනුභව කරන්නේ ? යනුවෙන් ඇසීය. ඔවුහු ඔව් යනුවෙන් පිළිතුරු දුන්හ. එවිට එතුමා 'ඔබලා සමූහයෙන් අනුභව කරන්න. අනුභව කරන කළ බිස්මිල්ලාහ් උසුරන්න. අල්ලාහ් ඔබලාගේ ආහාරයෙහි බරකත් හෙවත් විස්තීරණය ලබා දෙයි' යනුවෙන් ප්‍රකාශ කළ බව වහ්ෂී බින් හර්බ් (රලි) තුමා වාර්තා කරන්නේය. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

## ❑-අනුභව කරන කළ

1-බිස්මිල්ලාහ් උසුරා ආරම්භ කිරීම. නබිනායක තුමා 'ඔබලා ආහාර අනුභව කරන කළ අල්ලාහ්ගේ නාමය (බිස්මිල්ලාහ්) උසුරා ආරම්භ කරන්න. ආරම්භ කරන කළ බිස්මිල්ලාහ් උසුරිමට අමතක වූයේනම්, (සිහිවූ කළ) බිස්මිල්ලාහි අව්වලහූ වආකිරහූ යනුවෙන්

මුස්ලිම්වරයා මේ සියල්ල නබිනායක මුහම්මදු (සල්) තුමා පිළිපැදීමේ හා අනුගමනය කිරීමේ චේතනාවෙන් කළ යුතුයි. මේවා කෙරෙහි කුලිය ලැබෙන්නේ හෙතම මෙම සිතුවිල්ල අනුවය. මක්තිසාදයත්, ක්‍රියාවන් සියල්ල සිතුවිල්ල අනුවම පිහිටේ. සෑම මිනිසෙකුටම ඔවුනොවුන්ගේ සිතුවිල්ල අනුවම කුලිය ලැබෙන්නේය.

# නිදාගැනීමෙහි සාරධර්ම

මුස්ලිම්වරයා නින්ද අල්ලාහ් තම දාසයන්ට පිරිනැමූ දායාදයක් වශයෙන් සැළකිය යුතුයි. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

ඔහු ඔබලා කෙරෙහි රාත්‍රිය හා දහවල සකසා දීම ඔහු (අල්ලාහ්)ගේ භාග්‍යයෙන් එකකි. මෙය ඔබලා (රාත්‍රියෙහි) විවේක ගැනීම හා (දහවල්හි) ඔහුගේ දායාදයන් සොයා ගැනීම සඳහාය. (මේ කෙරෙහි) ඔහුට ඔබලා තුතිය පුද කරන්න. *(අල්කුර්ආන්-28:73)*

මුස්ලිම්වරයා නිදා ගන්නා කල පහත සඳහන් සාරධර්මයන් අනුගමනය කිරීම මෙම භාග්‍යයට තුති පුද කිරීමක් වශයෙන් පවතී.

1-ඉගෙන ගැනීම, අමුත්තන් සමග කතාබහක යෙදීම හා සිය බිරිඳ සමග අල්ලාප සල්ලාපයෙහි යෙදීම යනාදි හේතුවෙන් තොරව ඉෂා දෛනික නැමදුමෙන් පසු නිදාගැනීම ප්‍රමාද නොකළ යුතුයි. 'නබි නායක තුමා ඉෂා දෛනික නැමදුමට පෙර නිදාගැනීම හා ඉෂා දෛනික නැමදුමට පසු (නිශ්ඵල) කතා බහක යෙදීම අප්‍රිය කළේය'

